# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.01.21 මාධ්‍ය නිවේදන අංක 2026/006/R

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රුපියල් 50,000/- (රුපියල් පනස්දහස) ක මුදලක් අල්ලස් ලෙස පිරිනැමීමේ චෝදනාව මත යතුරු පැදි කාර්මිකයෙකු අත්අඩංගුවට</u>**

බෙම්මුල්ල පොලිස් ස්ථානයේ, උප පොලිස් පරීක්ෂකවරයෙකු විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව, නියමිත ධාරිතාවයට වඩා වැඩි යතුරු පැදියක් මාර්ගයේ ධාවනය කිරීම සහ ලියා පදිංචි නොකර ධාවනය කිරීම යටතේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති යතුරු පැදිය සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු නොකර අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් තොරව නැවත යතුරු පැදිය ලබා දෙන ලෙසට ඉල්ලා ඒ සඳහා රු.50,000/- (රුපියල් පනස්දහස) ක අල්ලස් මුදලක් පිරිනැමීමේ චෝදනාව මත කළගෙඩිහේන ප්‍රදේශයේ පදිංචි යතුරුපැදි කාර්මිකයෙකු 2026.01.21 වන දින පෙ.ව. 10.50 ට පමණ බෙම්මුල්ල පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපතිවරයාගේ නිල මේසය ඉදිරිපිට දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

අත්අඩංගුවට ගත් සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672